සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා උණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/6/EP/08/Hou.Ap 2020
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.10.08

දිස්ත්‍රික් ලේකම්/දිසාපති/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**"සෞභාග්‍යා" සමෘද්ධි නිවාස වැඩසටහන -2020/2021**

ජාත්‍යන්තර දිළිඳුකම පිටුදැකීමේ දිනයට සමගාමීව ගරු අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන යටතේ නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතියෙන් 2020.10.17 වන දින සිට 2020.10.25 දින දක්වා සතියක් පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 01බැගින් නිවාස 331ක් ඉදිකිරීමේ **සමෘද්ධි නිවාස** වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙහිදී එක් නිවසක් වෙනුවෙන් රු. ලක්ෂ 06ක (රු. 600,000/-) මුදලක් ලබාදෙන අතර ප්‍රතිලාභී දායකත්වය හා ප්‍රභූ දායකත්වය ලබා ගනිමින් රු. ලක්ෂ 10කට (රු. 1,000,000/-) අවම වටිනාකමකින් යුත් නිවසක් ඉදිකිරීමට කටයුතු සම්පාදනය කළ යුතුය. මෙහිදී දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය ලේකම් විසින් පෞද්ගලිකව මෙම කාර්යය සාර්ථක කර ගැනීමට මැදිහත් වී කටයුතු කරන ලෙස අවධාරණය කරමි.

මේ සඳහා සමෘද්ධිලාභී පවුලක් හෝ අඩු ආදායම්ලාභී පවුලක් තෝරා ගැනීමට කටයුතු කළයුතු අතර අනිවාර්යෙන් අංක 01 නිර්නායකය හා තවත් එක් නිර්ණායකයක්වත් සපුරා තිබිය යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**01.** **සනාථ කර ගැනීමට අදාල නිර්ණායක**

නිවස සෑදීම සඳහා ස්ථිරව තමන් සතු ඉඩමක් තිබිය යුතුවීම සහ අනිවාර්යයෙන් පවුලේ සාමාජිකයින් 3 දෙනෙකු වත් සිටිම හෝ වැන්දඹු පවුලක් වීම හෝ ආබාධිත තත්ත්වයෙන් පවුලේ කෙනෙකු සිටීම (විශේෂයෙන් ගෘහ මූලික පිලිබඳව සලකා බලන්න) හෝ ආර්ථික මට්ටම සලකා බැලීමේදී ඉතා දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලක්වීම

මේ සඳහා අදියර 03ක් යටතේ දිස්ත්‍රික් කාර්යාල වලට ප්‍රතිපාදන ලබාදෙන අතර එක් නිවසක් වෙනුවෙන් ලබාදෙන මුදල රු. ලක්ෂ 06 (රු. 600,000/-) කි. මෙම මුදල රු. ලක්ෂය (රු.100,000/-) බැගින් අදියර 06ක් යටතේ ප්‍රතිලාභීන් වෙත ලබා දිය යුතුය.

**02.** **තෝරා ගැනීමේ ක්‍රියාවලිය**

**තෝරාගැනිම 01**

ඉහත සඳහන් කරුණු සඳහා මූලිකත්වය දෙමින්, නිවසක් නොමැති, නිවසක් ඉදිකර ගැනීමට හැකියාවක් නැති නමුත් නිවස ඉදිකර ගැනීමට තමා සතු ඉඩමක් හිමි පවුලක් තෝරා ගත යුතුය. තෝරා ගැනීම අංක 01 යටතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට එක් නිවසක් බැගින් තෝරාගත යුතුය.

**විශේෂයෙන් මෙම වැඩසටහන වෙනුවෙන් ලබාදෙන ආකෘති පත්‍රය මගින් පමණක්ම තොරතුරු ලබාදිය යුතු අතර මේ සඳහා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී වගකීම දැරිය යුතුය.**

**තෝරාගැනිම 02**

ප්‍රදේශිය ලේකම් කොට්ඨාසය තුල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවලින් හෙලිදරවු කරන විශේෂ නිවාස අවශ්‍යතා සඳහා තොරතුරු අනාවරණයවූ සැනින් ඒ පිළිබඳ ඔබගේ නිලධාරීන් ලවා පරීක්ෂා කර වාර්තාවක් ප්‍රධාන කාර්යාලයට ලබාදී අවශ්‍ය පහසුකම් සැලසිය යුතු අතර, එම තොරතුර ඉදිරිපත් කරන ලද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනය වෙත ඔබ විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය දැනුවත් කළ යුතුය.

විශේෂයෙන් ප්‍රජා මූල සමිති සභාපති, ලේකම්, වසමභාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, වසම අයත් කලාප කළමනාකරු, මූලස්ථාන කළමනාකරු හා ප්‍රාදේශීය ලේකම්ගේ නිරීක්ෂණ මත මෙම නිවස ඉදිකිරීම කළ යුතුය. ප්‍රතිපාදන නිදහස් කිරීමේදී රු. ලක්ෂ 05ක් (රු. 500,000/-) දක්වා කලාප/මූලස්ථාන කළමනාකරුවන්ගේ අවසන් වාර්තා අනුව මුදල් නිදහස් කළ හැකි අතර අවසන් වාරිකය නිදහස් කිරීමට පෙර තාක්ෂණ නිලධාරී වාර්තාව ලබා ගත යුතුය.

03. **මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වාරික නිදහස් කිරීමේ ක්‍රමවේදය :**

මෙහිදි දිස්ත්‍රික් කාර්යාල වෙත එක් නිවසකට රුපියල් ලක්ෂ02 බැගින් අදියර 03ක් යටතේ ප්‍රතිපාදන ලබා දෙන අතර 2020 ඔක්තොම්බර්, 2021පෙබරවාරි, 2020 මැයි ලෙස මුදල් ලබාදෙනු ඇත. මීට පෙර මුදල් අවශ්‍යවේ නම් දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ඉල්ලීම අනුව මුදල් ලබා දෙනු ඇත.

ප්‍රතිලාභීන් වෙත මුදල් නිදහස් කිරීමේදී අදියර 06 යටතේ මුදල් ලබාදීම සිදු කළ යුතුය.

| අදියර | ලබාදෙන මුදල | අවසන් කළ යුතු වැඩ සීමාව |
|---|---|---|
| අදියර 01 | රු.100000.00 | වැඩ ආරම්භ කිරීම හා අත්තිවාරම දක්වා . |
| අදියර 02 | රු.100000.00 | බිත්ති බැද අවසන් කිරීම. |
| අදියර 03 | රු.100000.00 | වහළ සෙවිලි කිරිම දක්වා |
| අදියර 04 | රු.100000.00 | කපරාරුව හා තීන්ත ආලේප කිරිම, බිම සකස් කිරීම |
| අදියර 05 | රු.100000.00 | දොර ජනෙල් දමා උපකරණ සවි කිරීම. |
| අදියර 06 | රු.100000.00 | සියළුම වැඩ අවසන් කොට තාක්ෂණ නිලධාරී වාර්තාව ලබා ගැනීමෙන් පසු ගෙවිය යුතුය. |

මෙම වැඩ සටහන 2020 ඔක්තෝම්බර් 17-25 අතර දිළිදුකම පිටු දැකීමේ ජාත්‍යන්තර දිනය අදාළ සතිය තුළ ආරම්භ කළ යුතු අතර 2021 මැයි මස 20 වන දිනට පෙර නිවාස ඉදිකිරිම අවසන් කර සියළු ගෙවීම් කටයුතු අවසන් කිරිමට කටයුතු කල යුතුය.

***04.*** **වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම *:***

1. දිස්ත්‍රික්ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික්කයේ සමස්ත වැඩසටහන පිළිබඳ අධීක්ෂණය හා මෙහෙයවීම.
2. ප්‍රාදේශීය ලේකම් - තම බල ප්‍රදේශය තුළ අධීක්ෂණය.
3. මූලස්ථාන කළමනාකරු/ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරු - නිවැරදි පවුලක් තෝරා ගෙන ඇත්ද යන්න සොයා බැලීම හා ඒ සඳහා නිර්දේශ ලබාදීම, නිවස ඉදිකිරීම හා සම්බන්ධව පසු විපරම, අධීක්ෂණය හා අදාල අංශ සමඟ සම්බන්ධීකරණය.
4. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී - පරිත්‍යාගශීලීන්ගේ සහයෝගය හා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රම දායකත්වය ලබාගනිමින් නිවස ඉදි කිරීමට උපරිම සහයෝගය ලබාදීම හා නිවසේ වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

මෙහිදී නිවසේ මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමු වාරිකය නිදහස් කිරීමෙන් අනතුරුව නිවසේ ඉදිකිරීමේ ප්‍රගතිය පරීක්ෂා කොට වාර්තා ලබා ගැනීමෙන් පසු දෙවන, තුන්වන, හතරවන, පස්වන හා හයවන වාරික නිදහස් කළ යුතුය. අවසන් වාරිකය නිදහස් කිරීමට පෙර තාක්ෂණ නිලධාරී වාර්තාව නිවැරදිව ලබාගැනීම අනිවාර්ය වේ.

තෝරාගත් නිවාස වල නිවස ඉදිකිරීමට පෙර ඡායාරූප හා නාම ලේඛන පහත ආකෘතියට අනුව සකස් කර 2020.10.15 දිනට පෙර ව්‍යවසාය සංවර්ධන අංශයේ marketing@samurdhi.gov.lk ඊ මේල් ලිපිනය වෙත යොමු කරන්නේ නම් මැනවි.

මෙම නිවස ඉදි කිරීමේදී ප්‍රතිලාභියා සතු ඉඩමේ පිහිටීම අනුව සුදුසු නිවාස සැලසුම තෝරා ගත යුතුය.(අදාල නිවාස සැලසුම් ආකෘති පත්‍ර අංක I හා II මෙයට අමුණා ඇත.)

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | බැංකුව | වසම | නම | ලිපිනය | හේතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

"සෞභාග්‍යයේ දැක්ම" යටතේ සිදු කෙරෙන සෞභාග්‍යා සමෘද්ධි නිවාස වාසනා වැඩසටහන සාර්ථක කර ගැනීමට අදාල නිලධාරීන් මෙහෙයවන ලෙසත්, මෙය ප්‍රමුඛ රාජකාරියක් ලෙස සලකා ඔබගේ සක්‍රීය දායකත්වය ලබාදෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01.ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා,
ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත්
සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි

02. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි .සං.දෙ - අ.ක.ස